# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2465/16 - 2025 දෙසැම්බර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2025.12.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

5 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, **"දිට්වා සුළි කුණාටුවෙහි බලපෑමට ලක්වූ පුද්ගලයන්ට පහසුකම් සැලසීම සඳහා වන ආපදාවෙන් නැවත යථා තත්ත්වයට පැමිණීමේ ව්‍යාපෘතිය"** සඳහා සහනදායි පියවර වශයෙන් ලබා දීමට හෝ අත්‍යවශ්‍ය මහජන සේවා අඛණ්ඩව පවත්වා ගැනීමට පහසුකම් සැලසීම සඳහා ඕනෑම විදේශ රාජ්‍යයන්ගේ (රජයන්), ව්‍යාපාරික ආයතන, ස්වේච්ඡා සංවිධාන සහ හිතෛෂීන් ඇතුළු සංවිධාන වෙතින් ඕනෑම රාජ්‍ය ආයතනයකට, රජය මගින් අනුමත ආයතනවලට හා යම් රාජ්‍ය ආයතන සමග සෘජු සහයෝගීතාවයෙන් සහන ක්‍රියාකාරකම්වල නියුක්ත ආයතනවලට ආධාර/ පරිත්‍යාග වශයෙන් ලැබීමට නියමිත යම් අනුප්‍රමාණයකින් විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ගෙවිය යුතු වන්නා වූ ආනයනය කරන අත්‍යවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අත්හරිනු ලැබීම සඳහා නියමයක් මෙයින් නිකුත් කරන අතර, එය පහත කරුණුවලට යටත් වනු ලැබේ:

(අ) ව්‍යාපෘතිය සඳහා වූ ආනයනයන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නමට හෝ එකී නිලධාරීන් වෙනුවෙන් ලැබිය යුතුය. තව ද, මෙම ව්‍යාපෘතියේ භාවිතය උදෙසා සිදුකරන භාණ්ඩ ආනයනයන් සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉවත් කිරීම සඳහා වන නිර්දේශ ලිපියක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කළ යුතුය.

(ආ) උක්ත (අ) හි සඳහන් නිර්දේශය ලැබීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සියලු පරිත්‍යාග අනුමත කළ යුතු ය;

(ඇ) අපේක්ෂිත කාර්යය (කාර්යයන්) සඳහා සහ ප්‍රතිලාභීන් වෙත නොමිලේ ලබා දීම සඳහා එවැනි භාණ්ඩ ලබාදීම හෝ බෙදා හැරීම සිදුවන තෙක් උක්ත (අ) හි සඳහන් මෙම කාර්ය පරිපාටිය යටතේ ආධාර/ පරිත්‍යාග වශයෙන් ලැබෙන භාණ්ඩ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වගකීම හා වගවීම දැරිය යුතු ය; සහ




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) භාණ්ඩාගාර ලේකම්වරයාගේ පූර්ව අනුමැතියක් ලබාගැනීමෙන් තොරව, මෙම කාර්ය පරිපාටිය යටතේ ආධාර/ පරිත්‍යාග වශයෙන් ලැබෙන භාණ්ඩ ඉහත සඳහන් කෙරෙන කාර්යය හැර වෙනත් කාර්යයන් වෙනුවෙන් විකිණීම, බැහැර කිරීම හෝ භාවිතා කිරීම සිදුකළ නොහැකි වේ. මෙම කාර්ය පරිපාටිය උල්ලංඝනය වන අවස්ථාවක දී, අදාළ බදු අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් රේගු ආඥාපනතේ විධිවිධාන යටතේ ක්‍රියාමාර්ග ගත යුතු ය.

2. ජාතික හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීමට අදාළව නිකුත් කළ 2025.11.28 දිනැති අංක 2464/31 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයට හා අත්‍යවශ්‍ය සේවාවන් ප්‍රකාශයට පත්කිරීමට අදාළව නිකුත් කළ 2025.11.28 දිනැති අංක 2464/29 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයෙහි උපලේඛනයේ අයිතම අංක 7ට අනුකූලව සහ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාගේ එකඟතාවය මත මෙම නියමය ප්‍රකාශයට පත්කරනු ලැබේ.

3. මෙම නියමය, 2025 දෙසැම්බර් මස 05 වැනි දින සිට ආරම්භ වන වසරක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවැතිය යුතු ය.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 04 වැනි දින,
කොළඹ 01 දී ය,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙ දී ය.

EOG 12 - 0015

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.